ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන
6 වන මට්ටම 2022/2023
අවසාන පරීක්ෂණය - 2023
පුනරුත්ථාපනය හා ප්‍රජා මූලික පුනරුත්ථාපනය - SNU6225/ESU4125
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.12.09 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. පුනරුත්ථාපනය යන යෙදුම ඔබේ වචනවලින් නිර්වචනය කර එක් උදාහරණයකින් පැහැදිලි කරන්න.

02. සුදුසු උදාහරණ තුනක් (03) සමඟ ඌනතාවය යන පදය ඔබේ වචනවලින් පැහැදිලි කරන්න.

03. දුබලතා සහිත පුද්ගලයන් පිළිබඳ ශ්‍රී ලංකා සමාජයේ පවතින මිථ්‍යාවන් පහක් (05) ලැයිස්තුගත කරන්න.

04. දුබලතා සහිත පුද්ගලයන්ගේ අධ්‍යාපන පනතේ (IDEA) මූලධර්ම හය (06) ලැයිස්තුගත කරන්න.

05. CBR වැඩසටහන්වල ක්‍රියාකාරකම් පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ස්ව සහයක කණ්ඩායම් වලින් (SHGs) අවසානයේ අපේක්ෂා කරන දෑ පහක් (05) නම් කරන්න.

07. ප්‍රජා මූලික පුනරුත්ථාපනයේ මූලික අරමුණ සඳහන් කරන්න. සුදුසු උදාහරණයකින් පැහැදිලි කරන්න.

08. එක්සත් ජනපදයේ 1973 පුනරුත්ථාපන පනතේ 504 වගන්තිය ට අනුව, දුබලතා සහිත සියළුම ළමුන් සඳහා යෝග්‍ය ඉඩ සැලසීම් සිදු කිරීමට පාසල නමැති ආයතනය අවශ්‍ය කරන බව අවධාරණය කරයි.

    මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) වෛද්‍ය ආකෘතිය සහ සමාජ ආකෘතිය අතර ඔබ නිරීක්ෂණය කර ඇති කැපී පෙනෙන වෙනස් ලක්ෂණ පහක් **(05)** ඔබේ වචනවලින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) "දුබලතා සහිත පුද්ගලයින් නුගත් බවට පත්වීමේ ඉහළ අවදානමක් ඇති අතර එය බොහෝ විට අධ්‍යාපනයට, රැකියාවට සහ ආදායමට ඇති ඉඩකඩ සීමා කිරීමට හේතු වේ." ශ්‍රී ලංකාවේ තත්ත්වය සලකා බලා සුදුසු උදාහරණ සහිතව මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 07)

(iii) දුබලතාවය සඳහා සමාජය තුළ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම කෙරෙහි, සමාජ ආකෘතිය තුළින් අවධානය යොමු කරන ආකාරය සුදුසු උදාහරණ පහක් **(05)** සමඟින් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

10. (i) ප්‍රජා මූලික පුනරුත්ථාපනය සඳහා එක්සත් ජාතීන්ගේ (UN) නිර්වචනය ලියන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ දුබලතා සහිත දරුවන් සඳහා ප්‍රජා මූලික පුනරුත්ථාපන සභාගේ අවශ්‍යතාව සහ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ඔබට CBR මගින් අනුබල දෙන දුබලතා සහිත දරුවෙකු සිටින පවුලක් හමු වූ බව සිතන්න. CBR වැඩසටහන මගින් ඔවුන් සවිබල ගන්වන්නේ කෙසේද යන්න ඔවුන් සමඟ සාකච්ඡා කර, ඔබේ පාසල් සඟරාවට වාර්තාවක් නිර්මාණය කර ලියන්න. (වචන 500) (ලකුණු 08)

11. (i) දුබලතා සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන පනත (IDEA)සහ එක්සත් ජනපදයේ 1973 පුනරුත්ථාපන පනතේ 504 වගන්තිය යන දෙකෙහි ම දුබලතා සහිත දරුවන්ට බලපාන ෆෙඩරල් නීතිවල භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ දුබලතා සහිත පුද්ගලයින්ට අදාළ ප්‍රධාන නීති සම්පාදන උපකරණ පහක් **(05)** නම් කරන්න. ඒවායින් තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) එක්සත් ජනපදයේ 1973 පුනරුත්ථාපන පනතේ 504 වගන්තියට අනුව ආබාධ සහිත දරුවන් පුනරුත්ථාපනය කිරීමේ දී ප්‍රතිපත්ති, භාවිතයන් සහ ක්‍රියා පටිපාටිවලට අදාළ පාසලේ භූමිකාවන් පහක් **(05)** ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

12. (i) දුබලතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට (UNCRPD) අනුව ශ්‍රී ලංකාවේ දුබලතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් නීත්‍යානුකූල ව ආරක්ෂා කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) UNCRPD (2006) හි 24 වැනි වගන්තියට අනුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන් සඳහා ජීවිත කාලය පුරාම ඉගෙනීමේ, සියලු මට්ටම්වල දී රාජ්‍ය පාර්ශවයන් විසින් අන්තර්කරණ අධ්‍යාපනය සහතික කරන ආකාර පහක් **(05)** විස්තර කරන්න. (ලකුණු 07)

(iii) ඉහත දූබලතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි (UNCRPD) 24 වන වගන්තියට අදාළව, ශ්‍රී ලංකාව තුළ හඳුනාගත හැකි ගැටළු විවේචනාත්මක ව විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

13. (i) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පුනරුත්ථාපනය කිරීමේ දී පවුලේ කාර්ය භාරයන් **පහක් (05)** හඳුනාගෙන ලැයිස්තුගත කර ඒවායින් **තුනක් (03)** සුදුසු උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

(ii) ප්‍රජා සහභාගීත්වය යනු කුමක් දැයි පැහැදිලි කර ප්‍රජා සහභාගීත්වයට ඇතුළත් කළ යුතු ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(iii) ප්‍රජා නායකයින් විසින් ඉටු කළයුතු ක්‍රියාකාරකම් හෝ භූමිකාවන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

14. (i) දූබලතා සහිත පුද්ගලයින් සවිබල ගැන්වීම සඳහා ප්‍රවේශ **පහක් (05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ තත්ත්වය සම්බන්ධයෙන් ඉහත ප්‍රවේශයන් **දෙකක් (02)** උදාහරණ සහිතව භාවිතා කරන්න. (ලකුණු 07)

(iii) CBR කණ්ඩායම විසින් සපයනු ලබන සේවාවන් සඳහා ඔවුන්ගේ භූමිකාවන් සහ ඒ සඳහා ඇතිවන බාධක පරීක්ෂා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.